සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

Enu

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

| | |
|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **I, II** |
| சிங்களமொழியும் இலக்கியமும் | **I, II** |
| Sinhala Language and Literature | **I, II** |

| | | | |
|---|---|---|---|
| පැය තුනයි | අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| *மூன்று மணித்தியாலம்* | மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| *Three hours* | Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** මුළු රට ම **දෙබරයට ගල් ගැහුවාක් මෙන්** ඇවිළී ගියේ ය.
(1) මහා විනාශකාරී ස්වරූපයකින්
(2) නොසිතූ ආකාරයේ අනතුරකින්
(3) කලින් සැලසුම් කළ ක්‍රියාවකින්
(4) අනපේක්ෂිත ආකාරයේ නොසන්සුන්කමකින්

**2.** රෝගියා ජීවත් වූයේ **වළ පයක් ගොඩ පයක් තබා ගෙන** ය.
(1) දැඩි පීඩනයකින්
(2) දැඩි අසහනයකින්
(3) දැඩි පිළිකුලෙන්
(4) දැඩි අවිනිශ්චිතතාවකින්

**3.** කමල් සහ නිමල් කටයුතු කළේ **තයින් පොලොගුන් සේ** ය.
(1) ඉතා අවිශ්වාසයෙන්
(2) දැඩි අප්‍රසාදයෙන්
(3) අධික වෛරයෙන්
(4) මහත් සැකයෙන්

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** තමා අතින් වරදක් සිදු වූ අවස්ථාවක වඩාත් යෝග්‍ය වනුයේ ස්වයං ................................ යෙදීම ය.
(1) අධීක්ෂණයක (2) නිරීක්ෂණයක (3) පරීක්ෂණයක (4) විවේචනයක

**5.** ප්‍රතිභාපූර්ණ නිර්මාණකරුවකුගේ වැදගත් ලක්ෂණයක් වන්නේ ........................................ භාෂාවක් භාවිත කිරීම යි.
(1) ගූඪාර්ථවත් (2) ව්‍යංග්‍යාර්ථවත් (3) නිශ්චිතාර්ථවත් (4) සංශයාර්ථවත්

**6.** ලබන සතියේ කාලගුණ තත්ත්වය පිළිබඳ කාලගුණ විද්‍යාඥයා ................................ යෙදෙයි.
(1) කථෝපකථනයක (2) පුරෝකථනයක (3) විමර්ශනයක (4) සමාලෝචනයක

Enu

[දෙවැනි පිටුව බලන්න.

36. "දත් දෙපළ සිහින් ය, දීප්තිමත් ය. **කපා ඔප මට්ටම් කරන ලද හෙයින් විදුරුමිණි දෙපළක් මෙන් සිලුටු ය.**"

ඉහත පාඨයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටස

(1) අතිශයෝක්තියකි.
(2) රූපකයකි.
(3) උපමාවකි.
(4) ස්වභාවෝක්තියකි.

37. අසඩක්, නටාලියා, සයිමන් යන චරිත අන්තර්ගත වන නාට්‍යය කුමක් ද?
(1) දූන්න දූනුගමුවේ
(2) තලමල පිපිලා
(3) හුණුවටයේ කතාව
(4) නරි බෑනා

38. "පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවේ පෙරළි ඇත
මිදුල පුරා වියළුණු කොළ
ඒ මේ අත විසිර තිබේ
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු ඇල්ල නිවී ගොස් ය
ඉදහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩු බුරනු ඇසේ"

ඉහත සඳහන් පද්‍යයෙන් කියැවෙන්නේ,
(1) මරණයක් පිළිබඳ ව ය.
(2) අපිරිසිදුකම පිළිබඳ ව ය.
(3) කලහකාරී අවස්ථාවක් පිළිබඳ ව ය.
(4) අතීත නිවාසවල ස්වභාවය පිළිබඳ ව ය.

39. පතල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'සන්නම්' යනු
(1) වටිනා ගල් වර්ග ය.
(2) නොවටිනා ගල් ය.
(3) වැඩ කුලිය ය.
(4) කුඩයට දමන පස් ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
"පාසලේ අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම රැකියා අංශයට පිළියමක් ලෙසත් බලපෑවේ ය. මෙය හුදු අත්කම් ඉගැන්වීමක් නොව ශිෂ්‍යයාගේ නිර්මාණශීලීභාවය අවදි කිරීමක් ද විය."
(1) පාසල් අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම මගින් රැකියා අංශයට විසඳුමක් ලැබුණා පමණක් නොව ශිෂ්‍යයාගේ නිර්මාණශීලීත්වය මතුවීම ද සිදු විය.
(2) පාසල් අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම මගින් රැකියා හිඟය මගහැරුණු අතර අත්කම් ඉගැන්වීමෙන් ශිෂ්‍යයා නිර්මාණකරණයට යොමු කිරීම ද සිදු විය.
(3) රැකියා හිඟයට පිළියමක් ලෙස ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම අධ්‍යාපනයට ඇතුළත් කිරීමෙන් අත්කම් ඉගැන්වීමත් නිර්මාණශීලී ශිෂ්‍යයන් බිහි කිරීමත් සිදු විය.
(4) ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම අධ්‍යාපනයට ඇතුළත් කිරීමෙන් රැකියා හිඟය නැතිවුණු අතර අත්කම් ඉගැන්වීමෙන් ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලීත්වය ද ඉස්මතු විය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අන්තඃස්ථාක්ෂර **දෙකක්** ලියන්න.

(ii) පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) නල (ආ) නළ

(iii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) පත්තිරු (ආ) කටුවල

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙක** උපුටා ලියන්න.
"ඇගේ දිගටි පැහැපත් මුහුණ දුටුවන්ගේ සිත් සතන් ප්‍රබෝධවත් කරයි."

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) මම උත්සවයට සහභාගි නොවීම මිතුරන්ගේ විමතියට හේතු විය.
(ආ) ගුරුවරයා ළමයෙක් ලවා කවියක් ලියවයි.

(vi) "හංසයන් වැවට **බැස** ඒ මේ අත **පිහිනද්දී** ළමයි සතුටු වූහ." යන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

(vii) පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති ලියන්න.
(අ) තරුණිය **දෙවඟනක** මෙන් සැරසී සිටියා ය.
(ආ) පක්ෂියා **අත්තෙන්** අත්තට ඉගිල ගියේ ය.

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) ගංගා මුහුදට වැටෙන ස්ථානය
(ආ) මඩෙහි හට ගන්නා

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.
(අ) සම්මාන (ආ) ජනාකීර්ණ

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) පාඨකයෝ ගත් කතුවරුන් අගයති.
(ආ) වෛද්‍ය විශේෂඥයෝ කොවිඩ් රෝගය නිවාරණයට ඖෂධ නිපදවති.

(ලකුණු 02 × 10 = 20 යි)

**7.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ළසඳ, ශබ්ධය, දෘෂ්ටිපථය, කෙළවර
(2) කල්‍යාණ, දර්ශණීය, වනවදුල, වර්තමාන
(3) විරෝධාර, සමුච්ඡය, ස්තූපය, සුලකළ
(4) නිදර්ශන, දර්පණ, ධර්මිෂ්ඨ, විශිෂ්ට

**8.** 'කාක්කා, කුලය, කීර්තිය, කැකිරි' යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දිගු ඉස්පිල්ල හා කෙටි ඇදපිල්ල
(2) කෙටි පාපිල්ල, දිගු ඉස්පිල්ල, ඇලපිල්ල හා කෙටි ඇදපිල්ල
(3) ඇලපිල්ල, දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල හා කෙටි ඇදපිල්ල
(4) දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල හා ඇලපිල්ල

**9.** 'ධනපති' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) දන්තජ හා මූර්ධජ ය. (2) කණ්ඨජ හා දන්තජ ය.
(3) දන්තජ හා ඕෂ්ඨජ ය. (4) තාලුජ හා ඕෂ්ඨජ ය.

**10.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) ඉතාලිය, බ්‍රිතාන්‍යය, ජර්මනිය, සුඩානය
(2) ඉන්දියාව, කොරියාව, චීනය, ජපානය
(3) ඉන්දුනීසියාව, සිරියාව, රුසියාව, ටිබෙටය
(4) ඉතියෝපියාව, අමෙරිකාව, බ්‍රසීලය, ග්‍රීසිය

**11.** අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) සතුරකු, බැල්ලියක්, සිවලකු, මිනිසෙක්
(2) නීතිඥයෙක්, වෙළෙන්දෙක්, දාසයකු, වනිතාවක්
(3) ධනපතියකු, සිඟන්නකු, දරුවකු, ළදැරියක
(4) රෝගියෙක්, රියැදුරකු, ශිෂ්‍යාවක, වැඳිරියක්

**12.** "කුරුල්ලෝ සන්ධ්‍යා කාලයේ අහසෙහි පියාසර කරති" යන වාක්‍යයේ '**අහසෙහි**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) කරණ (2) කර්තෘ (3) අවධි (4) ආධාර

**13.** 'නවනිවෙස' යන්න අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට ය.
(3) අව්‍යය සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

**14.** 'සංවත්සර + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සංවත්සරික (2) සාංවත්සරික (3) සාංවාත්සරික (4) සංවාත්සරික

**15.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) සමාස - හුඹස්කට, රෝබිය, රියසක, බලුවලිගය
(2) අසම්භාව්‍ය ක්‍රියා - ගයන, නියන, වයන, දුවන
(3) සන්ධි - වංශාධිපති, අනියමාර්ථ, දේවාශීර්වාද, ව්‍යවස්ථානුකූල
(4) නිපාත - මෙන්, නිසා, තෙක්, වහා

**16.** **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) ඔහු සෙමින් කතා කළේ ය.
(2) ඈ ඔහු හා පෙමින් වෙළී සිටියා ය.
(3) වඳුරා මඳ දුරක් බිමින් ගමන් ගත්තේ ය.
(4) ගෙවිලිය ගොයම් කපමින් ගීයක් ගැයුවා ය.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**17.** **සෝදාහරණ ව** කරුණු දක්වන්න.
(1) තමා උදාහරණ කොටගෙන (2) උදාහරණ රහිත ව
(3) එක් උදාහරණයක් සහිත ව (4) උදාහරණ සහිත ව

**18.** එය **වෘත්තාභිමුඛ** පාඨමාලාවකි.
(1) රැකියාවකට අවධානය යොමු කළ (2) රැකියාවක් කැමැත්තෙන් කරන
(3) රැකියාවක් අරමුණු කරගත් (4) රැකියාවක් ලබා ගැනීම සඳහා පමණක් වූ

**19.** **විජයාගමනය** ලංකා ඉතිහාසයේ වැදගත් සිදුවීමකි.
(1) විජයගේ පැමිණීම (2) විජයගේ ආක්‍රමණය
(3) විජය රටින් පිට ව යාම (4) විජයගේ පිටත් වීම

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) වේල්ල, ජලාශය, කුඹුර, ඇළ
(2) ගවුම, කලිසම, සපත්තුව, අත් ඔරලෝසුව
(3) කියත, නියන, යතුකැටය, ගඩොල්
(4) කතුර, නූල් පන්දුව, ඇඳුම, ඉදිකටුව

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | පාද - බාහු, | නාදය - හඬ, | කන - කර්ණය, | පක්ෂියා - විහඟ |
| (2) | තාත්තා - පියා, | මිත්‍රයා - මිතුරා, | බල්ලා - සුනඛයා, | දත් - දසන් |
| (3) | තරුණයා - වැඩිහිටියා, | හඳ - චන්ද්‍රයා, | ගල - ශෛල, | සුළඟ - පවන |
| (4) | ස්ත්‍රිය - වනිතාව, | මහල්ලා - වෘද්ධයා, | නරියා - හිවලා, | පුෂ්පය - මහනෙල් |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පර්වතය - කන්ද, ගිරි, පව්ව, මුදුන (2) ඇස - නයන, නුවන, නේත්‍රය, අක්ෂි
(3) පද්මය - පියුම, සරෝජ, සියපත, නෙලුම (4) අහස - ගුවන, ආකාශය, නුබ, ගගන

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) ආමිෂ - නිරාමිෂ (2) අන්ත - අනන්ත
(3) උත්තම - අධම (4) ආදර - සමාදර

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'තෝ' යන්නෙහි ස්ත්‍රී ලිංග රූපය 'තී' යන්න යි.
(2) 'අවප්‍රමාණ' යන වචනයෙහි 'අව' යනු උපසර්ගය යි.
(3) සඤ්ඤක අක්ෂර, අර්ධ අනුනාසික යන නාමයෙන් ද හැඳින්වේ.
(4) 'යමු' යන්න වර්තමාන කාල, උත්තම පුරුෂ, ඒක වචන ආඛ්‍යාත පදයකි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) සාහිත්‍ය කලා සංවර්ධනය තුළින් සමාජ ප්‍රගමනයට හේතු වෙයි.
(2) අනාගත ශිෂ්‍ය ප්‍රජාවගේ අභිවෘද්ධිය තකා සියලු සැලසුම් සකස් කළ යුතු ය.
(3) අසීමාන්තික වස්තු ලෝභය සදාචාර සම්පන්න පුද්ගල සංවර්ධනය දියුණු කරයි.
(4) වර්තමාන කාලීන අවශ්‍යතාවලට අනුව අතීතයෙහි සිටි පාලකයන් ක්‍රියා කර ඇත.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** යමක් කියනවාට වඩා ක්‍රියාත්මක කිරීමේ දී වෙනස් වන බව
(1) කතාව දෝලාවෙන් ගමන පයින්
(2) ආඳමාළු ඉරට්ටෙන් කන්නා වාගේ
(3) කටින් බතල කොළ හිටවනවා වාගේ
(4) අබරා සිල්ගත්තා වාගේ

**27.** ඉතා කැමති දෙයක් අකමැති සේ හැඟවීම
(1) වක්කඩෙහි හකුරු හංගනවා වාගේ
(2) පනින රිළවුන්ට ඉණිමං තියනවා වාගේ
(3) ඉබ්බා දියට දමන විට ඇත්තැවෙ කිව්වා වාගේ
(4) අඬන්න ඉන්න මිනිහාගේ ඇහැට ඇඟිල්ලෙන් අනිනවා වාගේ

**28.** ස්වරාදේශ සන්ධියට හා ආගම සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) සූර්යෝදය, වියවුල් (2) නිරවුල්, සූර්යෝදය
(3) වියවුල්, නිරවුල් (4) වියවුල්, සූර්යෝදය

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) අපි එකී අපරාධයට වගකිවයුත්තන් වෙමු.
(2) ඔහු රකුසෙක් මෙන් මා වෙත කඩා පැන්නේ ය.
(3) ලේඛකයා ද ලේඛිකාව ද නවකතා රචනා කරන්නේ ය.
(4) කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වීමට සියල්ලන් ම මුඛ ආවරණ පැලඳිය යුතු ය.

**30.** (1) සියලු ශිෂ්‍යයන් දක්ෂයෝ නො වෙති.
(2) ඇතැමෙක් එකී පනතට විරුද්ධ වූහ.
(3) මග දෙපස ඇති වෘක්ෂයෝ සැමට සෙවණ දෙයි.
(4) මන්ත්‍රීවරයා නොහොත් මන්ත්‍රීවරිය සම්මන්ත්‍රණයට සහභාගි වන්නේ ය.

**31.** ● මම ඒ කණුව බිම පතිත වන .............................. බලා සිටිමි.
● රට, ජාතිය, ආගම .............................. වැඩ කිරීම මැනවි.
● එකී පාඨමාලාව .............................. ශිෂ්‍යයෝ ලියාපදිංචි කර ගැනෙති.
● පරාක්‍රමබාහු රජතුමා සිංහයකු .............................. නිර්භීත ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) වෙනුවෙන්, තෙක්, සඳහා, මෙන් (2) තෙක්, සඳහා, මෙන්, වෙනුවෙන්
(3) සඳහා, මෙන්, වෙනුවෙන්, තෙක් (4) තෙක්, වෙනුවෙන්, සඳහා, මෙන්

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"එකි ළිඳ ගාව උන්න"
(1) ඈය ළිඳ ළඟ සිටියි.
(2) ඈ ළිඳ ළඟ සිටින්නී ය.
(3) ඈ ළිඳ සමීපයෙහි සිටියා ය.
(4) ඇය ළිඳ සමීපයෙහි සිටිති.

**33.** පහත සඳහන් කවි දෙපදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
"පතසත් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුත් සුරත් පල වැනි වේ රිවි මඬල"
(1) ඉදුණු ගෙඩියක් බටහිර පර්වතයෙන් වැටෙන්නාක් මෙන් රත් පැහැ සූර්ය මණ්ඩලය පෙනේ.
(2) හිරු මඬල බටහිර පර්වතය නමැති නටුවෙන් වැටෙන්නට ආසන්න වූ ඉදුණු තද රතු ගෙඩියක් මෙනි.
(3) ඉදුණු ගෙඩියක් හිරු එළිය වැටීමෙන් රතු පැහැයෙන් පෙනෙන්නේ බටහිර පර්වතයෙන් වැටෙන්නාක් මෙනි.
(4) රතු පැහැ හිරු මඬල බටහිර පර්වතය නමැති නටුවෙන් වැටෙන්නට ආසන්න ගෙඩියක් මෙන් පෙනේ.

**34.** 'ප්‍රබුද්ධ' කාව්‍ය ග්‍රන්ථයේ රචකයා වන්නේ
(1) ගුණදාස අමරසේකර ය.
(2) සිරි ගුනසිංහ ය.
(3) පී. බී. අල්විස් පෙරේරා ය.
(4) මහගමසේකර ය.

**35.** පහත සඳහන් කවියේ හතර වන පදය දැක්වෙන වරණය තෝරන්න.
"රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
පාන්දරට යන්තම් ඇස පියෙන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ
................................................."
(1) එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ (2) හීනෙන් ඇවිත් නැනා අත වනන්නේ
(3) මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ (4) දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ

2. පහත දැක්වෙන **(අ). (ආ). (ඉ). (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට හෝ අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න. ඔබ **(ඊ)** තෝරා ගන්නේ නම් ඒ යටතේ ඇති විස්තරය ආරම්භය ලෙස යොදා ගනිමින් නිර්මාණාත්මක රචනයක් ගොඩනගන්න.

**(අ)** මත්ද්‍රව්‍ය උවදුර ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙන ගැටලුවකි. ශ්‍රී ලංකාවේ තරුණ පරපුර ද විවිධ මත්ද්‍රව්‍ය වෙත වේගයෙන් නැඹුරු වෙමින් පවතී. සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අංශ මත්ද්‍රව්‍ය වැටලීම් දිනපතා සිදු කළත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් කොතෙක් ක්‍රියාත්මක කළත් එහි අවසානයක් දක්නට නොමැත. රටේ සංවර්ධනයට සෘජු දායකත්වය සැපයිය හැකි ශ්‍රම බලකායේ ශක්තිය වන තරුණ පරපුර මෙසේ විනාශය කරා ඇදී යෑම සංකීර්ණ ප්‍රශ්නයකි.

**(ආ)** ශ්‍රී ලංකාව සියලු දෙසින් ම ඉන්දියන් සාගරයෙන් වට වී ඇත. ඒ නිසා ඉන්දියන් සාගරයෙන් සැහෙන ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට අයිති වේ. මත්ස්‍ය සම්පතට අමතර ව විවිධ ඛනිජ ඇතුළු සම්පත් රාශියක් සාගරයෙහි අන්තර්ගත වේ. මේ සම්පත් භාවිතයට ගැනීමෙන් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි ය. එහෙත් අප රට තවම එම සම්පත්වලින් නිසි ඵල නෙළාගෙන නොමැති බව පෙනේ.

**(ඉ)** පාසල් සිසුන්ගේ නව නිපැයුම් පිළිබඳ ජනමාධ්‍යවල නිතර අසන්නට හා දකින්නට ලැබේ. විවිධ වර්ගයේ වාහන, සෞඛ්‍යාරක්ෂණ උපකරණ ආදිය ද මේ අතර වේ. එහෙත් එම නව නිපැයුම් සමාජයට එක්වන්නේ ඉතා අල්ප වශයෙනි. ඊට හේතු වශයෙන් ඔවුන් සඳහන් කරන්නේ එම නිෂ්පාදන වෙළෙඳපොළට එක් කිරීමේ අපහසුතා පවතින බව යි. එබැවින් මෙම නව නිපැයුම්කරුවන්ට අත දී එම නිර්මාණ රටේ සංවර්ධනයට යොදා ගැනීමට අවස්ථාවක් උදාකර දීම කාලීන සමාජ අවශ්‍යතාවකි.

**(ඊ)** මම හාන්සි පුටුවක දිගා වී නවකතාවක් කියවමින් සිටියෙමි. ටික වෙලාවක් ගත වන විට පොත අතින් ගිලිහී දැස ද පියවෙනු යන්තමින් මතක ය. මහවනය මැද වැටී ඇති පාරක් දිගේ මම ගමන් කරමින් සිටියෙමි. මඟ දෙපස සත්තු ක්‍රීඩා කරමින් සිටිති. සිංහයෝ සහ ව්‍යාඝ්‍රයෝ මුවන් පිටුපස එළවති. හඳ එළිය ක්‍රමයෙන් පතිත වී ගස් අතුවල කොළ බබළන්නට විය. මා අතරමං වූවා සේ හැඟිණි...

(ලකුණු 25 යි)

3. පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පෘතුගීසි පාලනය පැවති කාලය සාමාන්‍යයෙන් පරම්පරා දෙකකට අයත් වේ. එයින් මුල් පරම්පරාව පෘතුගීසි දිවි පෙවෙතට අකමැත්තෙන් හෝ කැමැත්තෙන් හෝ හුරු ව ජීවත් ව සිටි පිරිස යි. දෙවැනි පරම්පරාව පෘතුගීසි ඌරුවට නිරායාසයෙන් ඇබ්බැහි වී ජීවත් වූ පිරිස යි.

පෘතුගීසින් ලංකාවේ මුහුදුබඩ පාලන බලය ක්‍රමයෙන් අල්ලා ගෙන අනුගමනය කළ වැඩපිළිවෙළ නම් මෙරට හැකිතාක් පිරිස පෘතුගීසි සිරිත්-විරිත්වලට පුරුදු කරවීම යි. ඒ සඳහා ඔවුහු ආගම උපයෝගී කර ගත්හ. කෝට්ටේ ධර්මපාල රජුත්, යාපනයේ රාජ කුමාරවරුනුත් ක්‍රිස්තියානියට හැරවීම එහි ප්‍රධාන කාර්යයකි. ඒ කාර්යය නිසා කෝට්ටේ රාජ්‍යයේත් උතුරේත් විසූ බොහෝ පිරිස් ක්‍රිස්තියානිය වැලඳ ගත්හ.

සිංහලයන් පෘතුගීසි ජීවිතය පිළිගත් ඒ සෑම අවස්ථාවක දී ම කුදුමහත් සට්ටන රාශියකට දෙපිරිස ම මුහුණ පෑහ. පෘතුගීසින්ට එරෙහි ව සිටි පිරිස් අතර මුල් තැන් ගත්තෝ භික්ෂූන් වහන්සේ යි. ආගමෝන්මාදයෙන් කටයුතු කළ පෘතුගීසිහු සඟ සතු දේපළ හා විහාරස්ථාන පමණක් නොව, හින්දු කෝවිල් ද විනාශ කළහ. පෘතුගීසි ව්‍යාපාරයට සහයෝගය නුදුන් ඔවුන්ගේ පාලනය යටතේ විසූවනට කිසිදු සහනයක් නො ලැබිණි. ඒ නිසා පෘතුගීසි ව්‍යාපාරය නොරිස්සූ ජනයා, විශේෂයෙන් භික්ෂූන් වහන්සේ කෝට්ටේ රාජ්‍යය අතහැර සිංහල රජුට අයත් පෙදෙස් කරා පලා ගියහ. එසේ යා ගත නොහැකිවූවෝ කරදර ගැහැට විඳිමින් තුෂ්ණිම්භූත ව සිටියහ. ඔවුන් කාලයත් සමග අභාවයට යත් ම, ඔවුන්ගෙන් ඇති වූ පිරිසත් පෘතුගීසි ගැති සිංහලයන් ඇතුළු පිරිසත් ඔවුන්ගේ පරපුරත් පෘතුගීසි සිරිත් විරිත් හා පැවතුම් අනුව වෙසෙන්නට පටන් ගති.

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ඈත අතීතයේ සිට ම අප රට පැවතිණැයි සිතිය හැකි නැටුම්, ගැයුම් හා වැයුම් සඳහා කවර ආකාරයක කරළියක් ප්‍රයෝජනයට ගැනිණි දැයි නිශ්චය වශයෙන් කිව නො හැකි ය. එහෙත් පුරාතන පොත්පත්වල සඳහන් වන පරිදි පැරණි ම කරළිය වනාහි රාජ සභා හා දේවස්ථාන ආශ්‍රිත ව පැවති බව නිගමනය කළ හැකි ය. ගැමි කලාවක් වන කෝලම් හෙවත් වෙස් මුහුණු නාටකය රඟ පෑවේ අනුග්‍රාහකයාගේ ගෙමිදුලෙහි තාවකාලික ව තනන ලද එළිමහන් රඟමඬලක ය. ඇතැම් විට ගැමි ශාන්ති කර්මයක් වන ගරායකුමට තනන අයිලයට සමාන වූ තොරණක් රඟමඬල පසෙකින් සාදා තිබිණි. සමහර පාත්‍රයෝ පළමු කොට ම අයිලයට නැඟී සිය වෙස් දක්වා ඉන් අනතුරු ව රඟමඬලට පැන නැටූහ. සොකරි නමින් හැඳින්වෙන ගැමි නැටුම ද එළිමහන් කරළියක රඟ දැක්විණි. බොහෝ විට සොකරි රඟපෑම පිණිස ගොයම් කපා පාගා අවසන් වූ වටකුරු කමත කරළිය වශයෙන් යොදා ගැනිණ. ගැමි නැටුම් ක්‍රමයක් උදෙසා තරමක් දුරට හෝ දියුණුවට පත් වූ රංග භූමියක් පළමු වරට ප්‍රයෝජනයට ගැනුණේ නාඩගම් සම්බන්ධයෙනි. නාඩගම් කරළිය වනාහි එළිමහන් බිමක පොළොවේ මට්ටමෙන් උස් කොට පස් ගොඩගසා ගැනීමෙන් සාදාගනු ලබන අර්ධ කවාකාර ස්ථානයකි. එය අසලින් නළුවන්ට වෙස් මාරුකර ගැනීම පිණිස් පොල්අතු සෙවිලි කළ මඩුවක් විය. එහි වහලය ඉදිරියට අවුත් පිටතට නෙරා ආ කරළිය ආවරණය වන අයුරින් ලී කණු දෙකක් මත රැඳී තිබිණි. මඩුවටත් කරළියටත් අතර දෙදෙනකු විසින් හරහට අල්වාගෙන සිටින කඩතුරාවක් විය. නළුවන් මඩුවේ සිට කරළියට පිවිසියේ කඩතුරාවේ එක් පසකිනි.

(i) අප රට පැරණි ම කරළිය කවර ස්ථාන ආශ්‍රිත ව පැවතියේ ද?

(ii) රංගන කාර්යයන් සඳහා එළිමහන් රඟමඬල යොදාගත් අවස්ථා දෙකක් දක්වන්න.

(iii) දියුණුවට පත් වූ රංග භූමියක් ප්‍රයෝජනයට ගැනුණේ කවර නැටුම් ක්‍රමයක් උදෙසා ද?

(iv) රංග භූමිය අසල පොල්අතු සෙවිලි කළ මඩුවක් තැනීමේ අරමුණ කුමක් ද?

(v) මෙහි සඳහන් කඩතුරාව යොදා තිබුණේ කවර ස්ථානයක ද?

(ලකුණු 02 × 5 = 10 යි)

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන **පුවත්පත් වාර්තාවක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

- '**උදාරගම**' නිතර වැසි ලැබෙන ප්‍රදේශයකි.
- කුඩා වැස්සකට පවා එම ප්‍රදේශය ගංවතුරෙන් යට වෙයි.
- ව්‍යාපාරිකයන් විසින් වගුරුබිම් ගොඩ කරනු ලැබීම ඊට ප්‍රධාන හේතුව යි.
- වැසි ජලය බැස යෑමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව ඇති ව පවතී.
- මේ සඳහා අදාළ බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු ය.

උදාරගම සමූහ වාර්තාකරු සුහානි කරුණාතිලක ඔබ යයි සිතන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **වෙළෙඳ දැන්වීමක්** සකස් කරන්න.

'**සරසි**' වේවැල් භාණ්ඩ අලෙවිසල 2021.07.18 දින සමගිපුර නගරයේ දී විවෘත කිරීමට එහි හිමිකරු සැරසෙයි. නිවසකට අවශ්‍ය මේස, පුටු, රාක්ක, කසළ බඳුන්, විසිතුරු භාණ්ඩ ඇතුළු විවිධ වේවැල් භාණ්ඩ අලෙවිසලේ ඇත. පෙ. ව. 10.00ට විවෘත වන අලෙවිසලෙන් එදින භාණ්ඩ මිල දී ගන්නා පාරිභෝගිකයන්ට 20%ක වට්ටමක් ද පිරිනැමේ. එදිනට පැමිණ වේවැල් භාණ්ඩ මිල දී ගන්නා ලෙස අලෙවිසලේ හිමිකරු සියලු පාරිභෝගිකයන්ට ඇරයුම් කර සිටියි.

(ලකුණු 15 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

Enu

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

**පැය දෙකයි**
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණ යැ යි සිතයි ද?"
   (අ) මෙම ප්‍රකාශය කළේ කවරකු ද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

(ii) දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
**සුර ගඳබුන් ලෙසට**
පටන් ගෙන වෙණ ගායනාවට
   (අ) පළමු පද්‍ය පාදයේ සඳහන් 'දෙදෙන ම' යනු කවරහු ද?
   (ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදයේ දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?

(iii) "ඔව් ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නෙ නෑ. උඹ පලයන් ළමයා ආපහු ගමට."
   (අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.
   (ආ) ප්‍රකාශය ශ්‍රවණය කළ අය දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iv) තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ
   (අ) කවියා සඳහන් කරන පරිදි මෙලොවට පලක් වන්නේ කුමක් කළ හොත් ද?
   (ආ) එස්. මහින්ද හිමියන් ලියූ ප්‍රථම කාව්‍ය කෘතිය නම් කරන්න.

(v) (අ) එච්. එම්. කුඩලිගම කවියා අයත් වන්නේ කුමන සාහිත්‍ය යුගයකට ද?
   (ආ) ඔහු ලියූ කාව්‍ය ග්‍රන්ථයක නම ලියන්න.

(vi) සැප සයනා සුවඳ බොජුන්
කුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ
   (අ) මෙම ප්‍රකාශය කරනුයේ කවරකු විසින් ද?
   (ආ) මෙම පද්‍ය ඛණ්ඩය උපුටා ගත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(vii) "නො බව, මහරජ, නො බව මහරජ මෙ දැන් කිහිඹියකු දු දිවි නොගළවයි. මුහු කෙරෙහි තට භය නැති"
   (අ) මෙහි 'මුහු' යනුවෙන් හැඳින්වූයේ කවරකු ද?
   (ආ) මෙම ප්‍රකාශය උපුටාගත් මුල් කෘතියේ නම ලියන්න.

Enu

[දෙවැනි පිටුව බලන්න.

Enu

(viii) (අ) සියබස්ලකර වනාහි කුමන ග්‍රන්ථයේ අනුවාදයක් ද?
(ආ) දොළොස්වන සහ දහතුන්වන සියවස් අතර කාලය තුළ ලියවී ඇතැයි සැලකෙන සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය නම් කරන්න.

(ix) පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
.........................................................
රසෙයි අමා රසමය ඒ පියස දුට

(අ) මෙම කවියේ තුන්වන පදය සම්පූර්ණ කරන්න.
(ආ) එළු අත්තනගලු වංශය, බුදුගුණ අලංකාරය යන ග්‍රන්ථවල රචකයා කවරෙක් ද?

(x) "හරියට ම මට කියන්න බෑ, ඒ වුණත් මං හිතනවා ජර්න්කු හාරසීයකින් විතර පිරිමහ ගන්න පුළුවන් වේවි කියලා"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශයෙහි සඳහන් වන්නේ කුමක් පිළිබඳ ව ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
**දුලබ** ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
**කිරඹ** පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) මෙහි සඳහන් විහාරයේ ස්වරූපය විස්තර කර ඇත්තේ කෙසේ ද?

(ii) "පිටැ බඳිනා ලද **හියොවුරු** ඇති වැ නැඟෙන ලද ධනුර්ධරයන් විසින් **උපලක්ෂිත** වූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල්මස් කැල සේ රිය සකින් රිය සක ගසා සිටුවන ලද රථ වළල්ලෙකින් ද...."
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි දැක්වෙන රූපකය සහ උපමාව උපුටා දක්වන්න.

(iii) පුන් මදාරා මල් දමින් මුදු
දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උර
තුර සරා දිළි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද
වෙණ නදින් එක් කොට ඉතා
**උන් එදා දුන් රඟ දුටොත් තව**
**සක් සැපත් කවරෙක්** පතා

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.
(ආ) මෙහි දැක්වෙන නාටිකාංගනාවන් වරලස සහ උරය සරසා ගත් ආකාරය දක්වන්න.

(iv) "සොර දූ එ සමාහි **දුඛිහොජනයෙනුදු** දුක්ඛසෙය්‍යායෙනුදු උකටලි වී. ඔහු මැරු මිනිස්හු එකක්හු උනු දහසක් දෙන යැ. හෙ වනාහි "එකකු විසින් දහස සපිරෙ" යි යන සිත් ඇති වැ "යමක්හු පළමු දිටිම් ද, ඔහු මරා ගණන් සපුරමි. ශිල්පයට උපචාර කොටැ ඇළි කප්වා නහා **පිළී පෙරළා** මවුපියන් දක්මි"
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) සොරා උකටලි වීමට හේතුවත් ශිල්පයට උපචාර දැක්වීම සම්පූර්ණ කිරීමට සිතූ ආකාරයත් කෙටියෙන් ලියන්න.

Enu

(v) අයි රාවණ වුවත් නවතන රිසින් එන
අයි රා දහස් දිලි **දුනු කොත් සිපත්** ගෙන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
**වයි යා කරන්** මල් තුරු ගන වන හිසින

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) කයිකාවලෙහි ආරක්ෂක විධිවිධානවල ශක්තිමත් බව කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?.

(ලකුණු 04 × 5 = 20 යි)

3. • මනා චරිත නිරූපණයත්
• අවස්ථා හා සිද්ධි ගැළපීමත්

"උග්ගසේන නම් සිටුපුත්‍රයාගේ වස්තුව" කථාවේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

• ස්වාභාවික පරිසරයේ චමත්කාරයත්
• සුලලිත පද සංඝටනයත් නිසා

සැළලිහිණි සංදේශය පාඨක සිත් අමන්දානන්දයට පත් කරයි.

නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

4. • මැටිල්ඩාගේ චරිතයත්
• ෆොරෙස්ටියර් මහත්මියගේ චරිතයත්

මගින් සමාජ පන්ති දෙකක යථා ස්වභාවය මනාව නිරූපණය කිරීමට දියමන්ති මාලය කෙටිකතා රචකයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

• සරල බස්වහරත්
• උචිත කාව්‍යෝපක්‍රම යොදා ගැනීමත්

"දෑතේ කරගැට සිඹ සනසන්නට" කවි පෙළ කෙරෙහි පාඨක සිත් ඇදී යාමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

• **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. වගා කටයුතුවල දී ගොවි ජනයා මුහුණපාන දුෂ්කරතාව කවියට නැගීමෙහි ලා ජන කවියා දක්වන සංවේදීභාවය "කුරහන් ඉසිමුව කළුවර බලාලා" යන කවි පෙළෙන් මනා ව නිරූපිත ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

6. සුප්පා දේවියගේ චරිතයෙන් නිරූපණය වන්නේ තම දරුවන්ගේ උන්නතිය වෙනුවෙන් කැපවන මවකගේ ස්වරූපය යි. නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. වීණා වාදනයේ මිහිරිබව තීව්‍ර කොට දැක්වීමට ගුත්තිල කවියා, රජවරුන්ගේ ප්‍රතිචාර යොදාගත් ආකාරය නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

***